# මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

---------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු පුස්තකාල 03 ට අයත් රු.30,738 ක් වටිනාකම වූ පුස්තකාල පොත් නොමැති බව 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වී තිබූ අතර එකී වටිනාකම් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වත්කම් වැඩියෙන් ගිණුම් ගතව තිබුණි.

(ආ) 2014 වර්ෂයේ නඩු පවරා ඇති ව්‍යාපාර බදු රු.9,790 ක් සඳහා දඩ මුදල් අයවීමට පෙර ජර්නල් සටහන් අංක 06 මගින් ණයගැතියන් බැර කර සමුච්චිත අරමුදල හර කර තිබුණෙන් එම ප්‍රමාණයට ණයගැති වටිනාකම අඩුවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට බලපත්‍ර ගාස්තු වලින් ලැබිය යුතු මුදල් රු.32,140 ක් වුවද එකී අගය ගිණුම් ගත නොකර මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 05 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවලට අනුව වටිනාකම රු.2,237,095 ක් වූ අතර උපයෝගි ලේඛන අනුව හා දෙන ලද තොරතුරු අනුව වටිනාකම රු.2,374,928 ක් වූයෙන් රු.137,833 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.51,992 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 30,447,298 ක් විය.

(ඇ) නිරවුල් නොකළ ගිණුම්

(i) ඉකුත් වර්ෂ 18 කට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු.1,295,398 ක ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ඉකුත් වර්ෂ 15 කට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.1,319,780 ක් වටිනා ණයහිමියන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.49,628,662 ක් වටිනා ගිණුම් විෂයයන් 03 කට අදාලව සමීක්ෂණ වාර්තා, ශේෂ සනාථ කිරීමේ ලිපි යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

සභාව විසින් මිළදී ගන්නා ලද පරිගණක හා උපාංග සඳහා ලේඛනයක් 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන පරිදි පවත්වා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,450,103 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.263,252 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 1,466 | 799 | 97 |
| කුලී මුදල් | 2,074 | 2,096 | 252 |
| වෙනත් ආදායම් | 31,387 | 10,579 | 31,124 |

### 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු බිල් කිරීම රු.191,906 ක් වූ අතර බිල් කිරීම වලින් ලැබීම් රු.2,089 ක් විය. මේ අනුව අයවීමේ ප්‍රගතිය සියයට 1 කි. 2014 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු

වටිනාකම රු.102,847 ක් වූ අතර 2014 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබීම් රු.38,548 ක් වූයෙන් අයවීමේ ප්‍රගතිය සියයට 37 ක් විය.

2.2.3 බදු කුලී
--------
සමාලෝචිත වර්ෂයේ ආරම්භක බදු කුලී ශේෂය රු.103,984 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුල ලැබීම් රු.12,799 ක් වූයෙන් ලැබීමේ ප්‍රගතිය සියයට 12 ක් විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (අ) | උසාවි දඩ | 894,759 |
| (ආ) | මුද්දර ගාස්තු | 8,312,510 |

2.2.5 ඉඩම් වෙන්දේසි බදු
-----------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 154(1) උප වගන්ති පරිදි ඉඩම් කැබලිකර විකිණීමේදී ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට 1 කට සමාන බද්දක් විකුණුම්කරුගෙන් අයකරගත යුතු වුවද, සුල්තානාගොඩ, අකුරුගොඩ පිහිටි නැටව්වත්ත ඉඩම, වෙන්දේසියේ විකිණීමේදී 2015 මැයි 31 දින වන විට කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. මෙම මුදල ගෙවන ලෙසට 1992 ජුලි 31, ඔක්තෝබර් 19, 2006 මැයි 20, 2008 ජුලි 01, 2008 ඔක්තෝබර් 19හා 2010 පෙබරවාරි 23 යන දිනවල විකුණුම්කාර ආයතනය වෙත ලිඛිත දැන්වීම් කර ඇතත් කිසිදු මුදලක් අයවී නොතිබුණි.

(ආ) මාලිම්බඩ සෙන්ට්‍රල් පාර්ක් නාකන්දගොඩවත්ත ඉඩම 2000 ජුලි 21 දින 341/2000 අනු බෙදුම යටතේ කැබලි 203 කට බෙදා වෙන්කර තිබූ අතර එයින් කැබලි 9 කට පමණක් සියයට 1 ක බදු වශයෙන් රු.7,757 ක් අය කර තිබූ අතර කැබලි 194 ක් සඳහා සියයට1 ක බදු අය කර නොතිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) උප වගන්තිය පරිදි බදු අය නොවීම මත 154(2) උප වගන්තියේ පරිදි සභා ලේකම්වරයා විසින් සියයට 1 ක බදු අයවීම පැහැර හැරීම සම්බන්ධයෙන් ඒ ප්‍රාදේශය සභාව සංයුක්ත වන ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයක නඩු පැවරිය යුතු වුවද එය සිදුව නොතිබුණි

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

3.1.1 සෙන්ට්‍රල් පාර්ක් ජල යෝජනා ක්‍රමය
----------------------------------------

මාලිම්බඩ නාකන්දගොඩ වත්ත ඉඩම සෙන්ට්‍රල් පාර්ක් නාමයෙන් 2000 ජුලි 21 දිනැති පිඹුරු අංක 341/2000 දරන කැබලි සැලැස්ම යටතේ වෙන්දේසි කිරීමට සහා අනුමැතිය ලබාදීමේදී, නල ජලය සැපයීම කොන්දේසියක් ලෙසට අදාල වෙන්දේසි සමාගම එකඟ වී තිබුණි.

වෙන්දේසිකාර සමාගමේ 2000 ජුලි 05 දිනැති ලිපියෙන් මෙම ඉඩමේ බීමට ජලය ලබාදීමට ප්‍රමාණවත් පහසුකම් ඇති බවත් බීමට ජලය ලබා ගැනීමට දිග අඩි 22ක් පළල අඩි 18 ක් හා ගැඹුර අඩි 25 ක් සහිත ළිඳක් ඇති බවත්, ජලය රැස්කරන ටැංකිය අඩි 18 ක් දිග අඩි 18 ක් පළල හා අඩි 16 ක් උසට ඉදිකර ඇති බවත් දක්වා තිබුණි.

එසේ තිබියදී අයවැය යෝජනා 2014 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන ක්‍රියාත්මක කිරීම යටතේ සභාව සෙන්ට්‍රල් පාර්ක් ජල යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීමේ 1 අදියර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.427,450 ක ඇස්තමේන්තුවක් සකස් කර සෘජු ශ්‍රමික පදනම මත ද්‍රව්‍ය හා ශ්‍රමය සඳහා රු.341,619 ක මුදලක් වැයකර තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වෙන්දේසිකාර සමාගම සෙන්ට්‍රල් පාර්ක් නමැති මෙම ඉඩමේ පානීය ජලය සැපයීම ඉඩම සංවර්ධනය කිරීමේදී කොන්දේසියක් ලෙසට ඉටුකර තිබියදී සභා අරමුදලින් ජල ටැංකියක් ඉදිකිරීම අවිධිමත් ගනුදෙනුවක් ලෙසට නිරීක්ෂණය කෙරේ.

(ආ) 2014 ජුලි 11 මුදල් කමිටුව අනුමත කළ ගබඩා කිරීමේ ජල ටැංකිය සඳහා සැලැස්මක් හෝ ඇස්තමේන්තුවට අදාල මිණුම් විස්තරද පිළියෙල කර නොතිබූ අතර මිළදීගන්නා ලද ද්‍රව්‍යවලින් හා ශ්‍රමය සඳහා වැයකළ මුදලින් ජල ටැංකිය ඉදිකළ බවට තහවුරු කෙරෙන මිණුම් වාර්තාද පිළියෙල කර නොතිබුණි.

3.1.2 භාණ්ඩ සමීක්ෂණය - 2014

2014 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2015 ජනවාරි 16 දින සභාව අනුමත කර තිබූ අතර සමීක්ෂණ වාර්තාවේ නිර්දේශය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

3.1.3 අංක PF-7353 දරන කැබ් රථය

(අ) සභාව වෙත 2014 දෙසැම්බර් මාසයේ ලැබී තිබූ කැබ් රථය සඳහා 2014 වර්ෂයේදී රු.22,200 ක් වටිනා ඉන්ධන ලීටර් 200 ක් නිකුත් කර ඇතත් එකී කාල පරිච්ඡේදයට අදාල දෛනික ධාවන සටහන් පත් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ආ) තවද මෙම කැබ් රථය සඳහා දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකළද ආදේශක රියදුරෙකු බඳවාගෙන රු.32,062 ක වැටුපක් ගෙවා තිබුණි. තවද 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 7 වන ඡේදයේ විධිවිධාන වලට පටහැනිවම මෙම රියදුරු බඳවා ගෙන තිබුණි.

3.1.4 අවිධිමත් ගනුදෙනු

දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ 2013 අප්‍රේල් 22 දිනැති අංක 1807/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රීති පරිදි සභිකයින් සඳහා ඉන්ධන දීමනා ගෙවනු ලබනුයේ සභා බල ප්‍රදේශයේ සභාවට අයත් කටයුතු සඳහා වුවද සභා බල ප්‍රදේශයෙන් පිටත සභාවේ කටයුතු සඳහා නොවන ගමන් සඳහා සභාවේ සභිකයෙකුට 2014 වර්ෂය තුල ගමන්කළ දුර කිලෝ මීටර් 1156 ක් වෙනුවෙන් රු.18,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ අනුව සභික ගමන් වියදම් දීමනා ගෙවීම අරමුණුගත කාර්යයන් සඳහා යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය කෙරේ.

3.2 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| තෘතියික | 01 | 02 | - | 01 |
| ද්විතියික | 17 | 16 | 01 | - |
| ප්‍රාථමික | 21 | 20 | 01 | - |
| වෙනත් (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 16 | - | - |
| | 39 | 54 | 02 | 01 |

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.12,123,207 ක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.14,565,895 ක මුදලක් වැයකර තිබුණෙන් සභා අරමුදලට රු.2,442,688 ක අතිරේක වැයබරක් ඇති වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් අතර, සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් සභාවේ අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය